**පදවිශ්‍රීපුර ප්‍රාදේශීය සභාව - 2022**

**--------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

පදවිශ්‍රීපුර ප්‍රාදේශීය සභාවේ 2022 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් හා වියදම් ගිණුම, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172(1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට පදවිශ්‍රීපුර ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළ කරනු ලැබේ.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාශර්වයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.
ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.
2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

### 1.4 විගණන විෂයපථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය

ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගැයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලැසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීති,රීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

### 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාතර්ාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

(අ) ප්‍රාදේශීය සභාවේ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (i) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේ දී මා විසින් සිදු කරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිදෙර්ශය |
|---|---|---|---|
| (අ) | පෙර වර්ෂයේ විගණනයේදී අනාවරණය වූ වැරදි නිවැරදි කිරීමේදී ඒවා වර්ෂයේ ආදායමට බැර කිරීම නිසා වර්ෂයේ ආදායම රු.5,414,241 කින් වැඩියෙන් දක්වා තිබුණි. | ඉදිරි වසරේ අවසන් ගිණුම් සැකසීමේදී මෙය සමුච්චිත අරමුදල මඟින් නිවැරදි කරන බව. | මූල්‍ය ප්‍රකාශන නිවැරදිව පිළියෙල කළ යුතුය. |
| (ආ) | 2021 වර්ෂයේ ඉදිකරන ලද අත්පන්දු ක්‍රිඩාංගනය හා කොන්ක්‍රීට් කරන ලද කොට්ට ගස් හංදිය මාර්ගය සඳහා ගෙවිය යුතු රු.1,034,607 ක් වර්ෂයේ වියදමට හර කර තිබුණි. | ප්‍රවර්ථන වර්ෂයේ වැය ශීර්ෂයට ඇතුළත් කර තිබීම සමුච්චිත අරමුදල මඟින් ගලපා නිවැරදි කරන බව. | -එම- |
| (ඇ) | පෙර වර්ෂයේ පරිත්‍යාග ලෙස ලැබුණ රු.436,000 ක් වටිනා තොගය ගිණුම්ගත කර නොතිබුණු අතර එම තොගයෙන් වර්ෂය තුළ භාවිතා කළ රු.76,219 ක් වියදමක් ලෙසද හඳුනාගෙන නොතිබුණි. | විගණනය මඟින් පෙන්වා දී ඇති පරිදි නිවැරදිව ගිණුම්ගත කරන බව. | -එම- |
| (ඈ) | සමාලෝචිත වර්ෂයේ ලැබිය යුතු ස්ථාවර තැන්පත් පොළිය රු.54,380 කින් වැඩියෙන් දක්වා තිබුණි. | 2023 අවසන් ගිණුම සකස් කිරීමේදී නිවැරදි කරන බව. | -එම- |
| (ඉ) | සමාලෝචිත වර්ෂයේ රු.8,817,621 ක් වැය කර නිවාඩු නිකේතනයේ ඉහළ මහළ පිළිසකර කිරීමේ වියදම ප්‍රාග්ධනිත කර නොතිබුණි. | 2023 වර්ෂයේ අවසන් ගිණුම් සැකසීමේ දී ප්‍රාග්ධනිත කිරීමට කටයුතු කරන බව. | -එම- |
| (ඊ) | සමාලෝචිත වර්ෂයේ සෞඛ්‍ය අමාත්‍යාංශයෙන් පරිත්‍යාග ලෙස ලැබු රු.450,000 ක් වූ ආයුර්වේද තොගය සහ ඉන් භාවිතා කළ රු.401,026 ක වටිනාකම ගිණුම්ගත කර නොතිබුණි. | 2023 අවසන් ගිණුම සකස් කිරීමේදී නිවැරදි කරන බව. | -එම- |
| (උ) | 2022 දෙසැම්බර් 31 දිනට ඉතිරි තොගය රු.3,510,820 ක් ආදායම් වියදම් ගිණුමට බැර කර තිබුණි. | -එම- | -එම- |

| | | | |
|---|---|---|---|
| (ඌ) | සමාලෝචිත වර්ෂයේදී පරිත්‍යාග ලෙස ලැබුණ රු.14,000,000 ක් වටිනා ජල බවුසරයේ වටිනාකම ප්‍රාග්ධන ආධාර ලෙස ගිණුම්ගත කර නොතිබුණි. | 2023 වර්ෂයේ අවසන් ගිණුම් සැකසීමේ දී ප්‍රාග්ධනිත කිරීමට කටයුතු කරන බව. | -එම- |
| (එ) | සභාවේ නිළධාරීන් දෙදෙනෙකුට ලබාදුන් රු.71,458 ක ණය මුදල ගිණුම්ගත කර නොතිබුණි. | -එම- | -එම- |
| (ඒ) | 2020 සහ 2021 වර්ෂ වෙනුවෙන් විගණන ගාස්තු රු.62,160 ක් ගිණුම්ගත කර නොතිබුණු අතර 2022 වර්ෂයේ විගණන ගාස්තු සඳහාද ප්‍රතිපාදන සලසා නොතිබුණි. | කඩිනමින් ගෙවීම් සිදු කරන බව. | -එම- |
| (ඔ) | සමාලෝචිත වර්ෂයේ ලබා දුන් නව ජල සැපයුම් වෙනුවෙන් ලැබිය යුතු රු.337,377 ක් ගිණුම්ගත කර නොතිබුණි. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | -එම- |

**1.6.2 නොසැසඳුනු පාලන ගිණුම්**

| **විගණන නිරීක්ෂණය** | **සභාවේ අදහස් දැක්වීම** | **නිදෙර්ශය** |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ගිණුම් ශේෂ 04 ක එකතුව සහ ඒවාට අදාළ උපයෝගී ලේඛන අනුව ශේෂ එකතුන් අතර රු.20,983,344 ක වෙනසක් විය. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | මූල්‍ය ප්‍රකාශන, අදාළ ලියවිලි සමග එකඟ විය යුතුය. |

**1.6.3 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම**

| **විගණන නිරීක්ෂණය** | **සභාවේ අදහස් දැක්වීම** | **නිදෙර්ශය** |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.191,314,686 ක් වටිනා ගිණුම් ශේෂ 18 ක් ඔප්පු, උපලේඛන, තොග වාර්තා, කේවල ශේෂ ලැයිස්තු සහ ශේෂ සනාථ කිරීම් ඉදිරිපත් නොකිරීම නිසා විගණනයේදී සතුටුදායක ලෙස පරීක්ෂා කළ නොහැකි විය. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | ගිණුම් විෂයන්ට අදාළ නිවැරදි තොරතුරු ඉදිරිපත් කළ යුතුය. |

## 1.7 අනුකූල නොවීම්

### 1.7.1 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම්

නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති, රීති රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | සභාවෙ අදහස් දැක්වීම | නිදෙර්ශය |
|---|---|---|---|---|
| (අ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත | | | |
| (i) | 24 වගන්තිය | සභාව විසින් ඉදිකිරීම් කරන ලද මාර්ග ඉන්වේන්ට්‍රිගත කර තිබූණ අතර එම මාර්ග සියල්ල ගැසට් කිරීමට කටයුතු කර නොතිබුණි. | ඉදිරියේදී ගැසට් කිරීමට කටයුතු කරන බව. | පවත්නා සියලු මාර්ග ඉන්වෙන්ට්‍රිගත කර ගැසට් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ii) | 134 වගන්තිය | සභාවේ බල ප්‍රදේශය තුළ පිහිටි දියුණු ප්‍රදේශ නිශ්චිතව කලින් කලට හඳුනාගෙන වරිපනම් හා බදු පැනවීමට කටයුතු කර නොතිබුණි. | ඉදිරියේදී ඒ සඳහා කටයුතු කරන බව. | ප්‍රාදේශීය සභා පනතේ 134 වගන්තිය අනුව කටයුතු කළ යුතුය. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදි ජනරජයේ මුදල් රෙගුලාසි 1646 | සභාව සතු වාහන 15 ක ධාවන සටහන් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | විගණනය මගින් පෙන්වා දී ඇති පරිදි දෛනික ධාවන සටහන් සෑම මසකම 15 දිනට පෙර ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව. | මුදල් රෙගුලාසි අනුව කටයුතු කළ යුතුය. |
| (ඇ) | 1988 ප්‍රාදේශීය සභා (මුල්‍ය හා පරිපාලන) රීති | | | |
| (i) | 193 වැනි රීතිය | අයවැය හා පරිපූරක සම්මත වැය සමඟ වැය විෂයන්හි තථ්‍ය වියදම් සසඳා අතිරික්තය හා ඌණනය පිළිබඳ හේතු දැක්වෙන ප්‍රකාශනය ගිණුම් සමඟ ඉදිරිපත් කර නොතිබුණි. | ඉදිරි වර්ෂයේ අවසන් ගිණුම සමග ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව. | ප්‍රාදේශීය සභා රීති අනුව කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ii) | 218 වැනි රීතිය | පිරිවැය රු.111,795,624 ක් වූ ඉඩම් හා ගොඩනැගිලි සමීක්ෂණය කර නොතිබුණි. | 2015 වර්ෂයට පෙර ස්ථාවර වත්කම්හි වටිනාකම් ලේඛනගතවී නොමැතිකමින් සොයා ගැනීමට අපහසු වී ඇත බව. | -එම- |

**1.7.2 බදු අවශ්‍යතාවයන්ට අනුකූල නොවීම**

| විගණන නිරීක්ෂණය | සභාවෙ අදහස් දැක්වීම | නිදෙර්ශය |
|---|---|---|
| 2006 අංක 12 දරණ මුද්දර බදු විශේෂ (විධිවිධාන) පනත අනුව 2019 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා වැටුපෙන් අය කර ගෙන තිබූ රු.25,500 ක මුද්දර ගාස්තු දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර නොතිබුණි. | මුදල් යැවීමට කටයුතු සිදු කරන බව. | මුද්දර බදු විශේෂ (විධිවිධාන) පනත අනුව කටයුතු කළ යුතුය. |

## 2. මුල්‍ය සමාලෝචනය

### 2.1 මුල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්ථන වියදම ඉක්ම වූ ආදායම රු.713,438 ක් වූ අතර ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ පුනරාවර්ථන වියදම ඉක්මවූ ආදායම රු.1,289,996 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, තත්‍ය ආදායම් හා හිඟ ආදායම්

සභාපතිවරයා විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් ප්‍රභවය | 2022 | | | | 2021 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | ඇස්තමේන්තු ගත ආදායම් | බිල්කළ ආදායම් | රැස්කළ ආදායම් | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තු ගත ආදායම් | බිල්කළ ආදායම් | රැස්කළ ආදායම් | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 |
| කුලී | 600 | 566 | 566 | 44 | 600 | 423 | 423 | 44 |
| බලපත්‍ර ගාස්තු | 675 | 549 | 647 | 161 | 675 | 484 | 435 | 259 |
| ජල බිල්පත් | 10,000 | 8,463 | 790 | 563 | 10,000 | 9,884 | 8,994 | 890 |
| එකතුව | 11,275 | 9,578 | 2,003 | 768 | 11,275 | 10,791 | 9,852 | 1,193 |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 වත්කම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිදේශය |
|---|---|---|
| ප්‍රාදේශීය සභාව භාවිත කරන වටිනාකම රු.18,009,050 ක් වූ වාහන 05 ක් නිසි පරිදි පවරා ගැනීමට සමාලෝචිත වර්ෂය තුළදීද කටයුතු කර නොතිබුණි. | මේ සම්බන්ධ පළාත් පාලන අමාත්‍යංශය හා මෝටර් රථ දෙපාර්ථමේනතුව සමඟ සාකච්ඡා කර ඇති අතර පවරා ගැනීමේ කටයුතු කඩිනමින් සිදු කරන බව. | විධිමත්ව පවරා ගැනීමට කටයුතු කළ යුතුය. |

### 3.2 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිදේශය |
|---|---|---|
| සභාවේ අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව සලකා බැලීමේදී තනතුරු 12 ක පුරප්පාඩු 20 ක් විය. | විගණනය විසින් පෙන්වා දී ඇති සභාව නිළධාරී පුරප්පාඩු සම්පූර්ණය කිරීමේ අවශ්‍යතාවය මත ආණ්ඩුකාර කාර්යාලයට, නියෝජ්‍ය ප්‍රධාන ලේකම් කාර්යාලයට ලිපි යොමුකර ඇති බව. | පුරප්පාඩු පිරවීමට කටයුතු කළ යුතුය. |

## 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 අභ්‍යන්තර විගණනය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිදේශය |
|---|---|---|
| සභාව විසින් අභ්‍යන්තර විගණන ඒකකයන් ස්ථාපනය කර තිබුණද ප්‍රවර්ථන වර්ෂයේදී ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි. | අභ්‍යන්තර විගණන නිළධාරියෙකු හා අභ්‍යන්තර විගණන කමිටු සභාව තුළ පත්කර ඇති අතර කාර්යය මණ්ඩලයෙහි හිඟකම හා පවතින රාජකාරී බහුල වීම හේතුවෙන් ක්‍රියාකාරී සැළැස්ම එලෙසින්ම ක්‍රියාත්මක නොවූ අතර ඉදිරියේදී මෙම අතපසුවීම් මගහරවා ගැනිමට කටයුතු කරන බව. | අභ්‍යන්තර විගණනය විධිමත් කළ යුතුය. |

### 4.2 පාරිසරික ගැටලු

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිදේශය |
|---|---|---|
| 1980 අංක 47 දරණ ජාතික පරිසර පනතට සිදුකළ සංශෝධන ප්‍රකාරව කටයුතු නොකිරීමත්, වර්ගීකරණය කර එකතු කරනු ලබන කසල නැවත මිශ්‍ර කිරීමත්, ඒවා නිදහසේ පරිසරයට මුදාහැරීමත් නිසා ගංවතුර ඇතිවන අවස්ථාවලදී මෙන්ම දැඩි වර්ෂා කාලවලදී අක්‍රමවත්ව බැහැර කරන ලද කසල ජල මාර්ගවලට ගසාගෙන යැමෙන් ජලජ ජීවීන්ට මෙන්ම මානව වර්ගයාටද පාරිසරික ගැටළු ඇතිවීම නිරීක්ෂණය විය. | සභාව සතු සීමිත සේවක මණ්ඩලය යොදා ගනිමින් දැනට රැස් කරනු ලබන කසල විධිමත් ලෙස පරිසර හානියක් නොවන ආකාරයෙන් බැහැර කරනු ලබන අතර ඉදිරියේදී වඩාත් ක්‍රමානුකූලවත් නියමිත ආකාරයටත් මෙය සිදු කිරීමට කටයුතු කරන බව. | කසල ක්‍රමවත්ව බැහැර කළ යුතුය. |